**ශීර්ෂය 197 - නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 බැදීම් හා බැරකම් ප්‍රකාශනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති බැදීම් හා බැරකම් ප්‍රකාශනය, භාණ්ඩාගාර බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ නොකිරීම හේතුවෙන් රු.199,083,986 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් භාණ්ඩාගාර බැදීම් හා බැරකම් සමඟ එකඟ කිරීමට කටයුතු කල යුතු වීම. | සියළුම අංශ හා ව්‍යාපෘති සතුව තිබූ සියලුම බැදීම් හා බැරකම් ලබා ගෙන රු.322,107,031.50 ක බැදීම් හා බැරකම් CIGAS වැඩසටහනට ඇතුළත් කරන ලද නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් වූයේ රු.123,023,045 ක බැරකම් පමණි. |

### 1.6.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

--------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | **රු.** | | | |
| (අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | 768,760 | • අවස්ථා 19 කදී ලබා දී තිබූ ඉන්ධන හා විවිධ අත්තිකාරම් පියවීමේ ප්‍රමාදය මාස 01 සිට මාස 04 දක්වා වූ කාල පරාසයක පැවතුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතු වන අතර කාර්ය නිමකල වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කල යුතු වීම. | මින් ඉදිරියට විවිධ කටයුතු සඳහා ලබා ගන්නා අත්තිකාරම් අදාල කටයුත්ත නිමවූ වහාම හෝ දින 14ක් තුල පියවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| | 111,440 | • අවස්ථා 04 කදී ලබාදුන් අත්තිකාරම් අදාල කාර්යය සඳහා වැය කිරීමකින් තොරව දින 8 සිට දින 40 දක්වා කාල පරාසයක් මුදල් අත රඳවාගැනීමෙන් පසු සම්පූර්ණයෙන්ම ආපසු පියවා තිබුණි. | | |
| (ආ) 2010 මැයි 14 දිනැති අංක සිඑස් / 1/17/1 දරන රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛය. | 3,425,280 | • විධිවිධාන නොසලකා අමාත්‍යාංශ නිලධාරීන් 06 දෙනෙකු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යමණ්ඩලයට අනුයුක්ත කර 2017 ජූනි මාසයේ සිට 2018 ඔක්තෝබර් මාසය දක්වා වැටුප් හා දීමනා ලෙස රු. 3,425,280 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතු වීම. | පැවරී ඇති රාජකාරී අනුව කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් තාවකාලිකව අනුයුක්ත කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයන් 12 ක් සඳහා වූ එකතුව රු.75,277,800 ක ප්‍රතිපාදනවලින් එක් එක් වැය විෂයය යටතේ සියයට 70 කට වැඩි ප්‍රතිශතයන්ගෙන් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන නිසි පරිදි සැලසුම් කර උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. | 2018 වර්ෂය මුල දී ඇස්තමේන්තු කළ පරිදි වියදම් පැන නොනැගීම මත මෙම වැය විෂයයන්හි ප්‍රතිපාදනවල ඉතිරි වීමක් සිදුව ඇත. |
| (ආ) වැය විෂයයන් 07 ක එකතුව රු.386,850,000 ක් වූ මූලික වියදම් ඇස්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ සියයට 114 සිට සියයට 353 ක් දක්වා වූ පරාසයකින් සංශෝධනයට ලක්කර තිබුණි. | තාත්වික පදනමින් ඇස්තමේන්තු පිළියෙල කල යුතු වීම. | වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් මෙම වැය විෂයයන් වෙත ප්‍රතිපාදන මාරු කරන ලදී. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැය විෂයයන් 09 කට අදාලව අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා එකතුව රු.1,962,722 ක බැරකම්වලට බැඳී තිබුණි. | විධිවිධාන ප්‍රකාරව අනුමත ප්‍රතිපාදන සීමාව තුල කටයුතු කල යුතු වීම. | භාණ්ඩාගාර ප්‍රතිපාදන අවශ්‍ය ප්‍රමාණයට සළසා නොතිබීමත්, අත්‍යාවශ්‍ය වියදම් සඳහා බැදීම් ඇතිකර ගත යුතු වීමත් මීට හේතු වී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** වාර්ෂිකව පාසල් පද්ධතිය තුලින් විශ්වවිද්‍යාල ප්‍රවේශය හෝ විධිමත් වෘත්තීය පුහුණුවක් හෝ නොලබන 150,000 ක් පමණ වූ තරුණ ප්‍රජාවට ගැලපෙන පරිදි වෘත්තීය පුහුණු අවස්ථා සඳහා පහසුකම් සම්පාදනය වී නොතිබුණි.<br>සමාලෝචිත වර්ෂයට අදාලව විගණනයට ලබා දුන් තොරතුරු අනුව විශ්වවිද්‍යාල හා විද්‍යායතන ඇතුළු ආයතන 367 කින් වෘත්තීය පුහුණුව සඳහා සිසුන් ඇතුලත් කර ගැනීම් 81,563 ක් විය. එසේම පුහුණු මධ්‍යස්ථාන මගින් පවත්වාගෙන යන පාඨමාලා සඳහා බඳවා ගත හැකි උපරිම සිසුන් ප්‍රමාණය බඳවා ගැනීමට එම ආයතන විසින් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බවත් නිරීක්ෂණය නොවීය. | නව වෘත්තීය පුහුණු අවස්ථා හා අවශ්‍යතා හඳුනාගත යුතු වීම සහ ඒ සඳහා නව පාඨමාලා ඇරඹීම හා පවත්නා පුහුණු ආයතන තවදුරටත් සංවර්ධනය කිරීමට කටයුතු කල යුතු වීම. | පාඨමාලා සඳහා ආයතන වෙත බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය දෙගුණ කිරීමේ කාර්යයට (අඩුම වශයෙන් සියයට 50කින්) ආයතන යොමු කිරීමට කළමණාකරණ කමිටු රැස්වීමේදී තීරණය වූ අතර ඒ අනුව ආයතන ප්‍රධානීන් විසින් සිසුන් බඳවා ගන්නා ප්‍රමාණය වැඩි කර ගැනීමට දැනට කටයුතු කරමින් පවතී. |
| **(ආ)** රැකියා වෙළෙඳපොලට උචිත ශ්‍රම බලකායක් ඇති කිරීම, කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම අමාත්‍යාංශයේ කාර්යයක් වුවද දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන ඒ මත පදනම්ව නව පාඨමාලා ඇති කිරීම, විෂයමාලා සංවර්ධනය කිරීම වැනි කාර්යයන් කෙරෙහි අවධානය යොමු වී ඇති බවක් නිරීක්ෂණය නොවිය. | දේශීය හා විදේශීය රැකියා අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව පාඨමාලා ඇරඹීම හා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කල යුතු වීම. | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දේශීය රැකියා වෙළඳපොළ හඳුනාගෙන Labour Market Bulleting නමැති තොරතුරු එකතුවක් ඒ සඳහා අනාගත පුරෝකථනයක්ද ඇතුළත් කර ඒ පිළිබඳව ආයතන දැනුවත් කරන ලෙසට අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී උපදෙස් ලබා දී ඇත. |
| **(ඇ)** 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් සහිත | පාඨමාලා ප්‍රතීතනය කිරීමෙන් ගුණාත්මක වෘත්තීය පුහුණුවකට | දුර බැහැර ප්‍රදේශවල පිහිටුවා ඇති වෘත්තීය පුහුණු ආයතනවල පාඨමාලා ප්‍රතීතනය සිදු කිරීමට |

| | | | |
|---|---|---|---|
| | (NVQ) පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම සිදුකල යුතු වුවද, විගණනයට ලද තොරතුරු අනුව අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන විසින් පවත්වනු ලබන පාඨමාලා 2834 ක් අතුරින් පාඨමාලා 561 ක් ප්‍රතීතනය කර නොතිබුණි. | අවස්ථා ලබා දීමට කටයුතු කල යුතු වීම. | අදාළ අවශ්‍යතා, එනම් අදාළ පාඨමාලා සඳහා පුහුණු කරුවන්, යටිතල පහසුකම්, පාඨමාලාවලට අදාළ යන්ත්‍රෝපකරණ යන අත්‍යාවශ්‍ය මූලිකාංග නොමැති වීම මත එම පාඨමාලා ප්‍රතීතනය කළ නොහැකි බවත් අදාළ අවශ්‍යතා සම්පූර්ණ කළ පසු ප්‍රතීතනය සිදු කළ හැකි බවත් දන්වා ඇත. |
| **(ඈ)** | අමාත්‍යාංශය යටතේ ඇති පුහුණු මධ්‍යස්ථානවල ඇතැම් පුහුණු පාඨමාලා සඳහා සිසුන්ගේ සහභාගීත්වයේ ප්‍රමාණාත්මක නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව සිසුන් 5 දෙනෙකුට අඩු පාඨමාලා 68 ක්ද, සිසුන් 6 ත් 10 ත් අතර වූ පාඨමාලා 29 ක්ද, සිසුන් 15 දෙනෙකුට අඩු පාඨමාලා 142 ක් ද විය. ප්‍රමාණවත් සම්පත් හා අවශ්‍ය සියලු පහසුකම් ලබා දී තිබියදී එම පාඨමාලා සිසුන් යොමුකිරීම කෙරෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති නිපුණතා සංවර්ධන සහකාර නිලධාරීන්ගේ අවධානය යොමු වී ඇති බවක් ද නිරීක්ෂණය නොවිය. | පාඨමාලා සඳහා සිසුන් ආකර්ශනය කර ගැනීමේ හා සිසු ආකර්ශනය අඩු පාඨමාලා සඳහා සිසුන් යොමු කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාවට නැංවීමට කටයුතු කල යුතු වීම. | 2019 වසරේ ජනවාරි ආරම්භ කර ඇති පාඨමාලා යථාර්ථීකරණ වැඩසටහන් (Rationalization) මඟින් සිසුන්ගේ සහභාගීත්වය අවම පාඨමාලා අදාළ ආයතන ප්‍රධානීන්ගේ එකඟතාව මත අවසන් කිරීමටත් වැඩි ඉල්ලුමක් පවතින පාඨමාලා අලුතින් ආරම්භ කිරීමටත් කටයුතු කිරීමට නියමිතය. මෙමඟින් ඉහත තත්වය අවම වනු ඇතැයි අපේක්ෂා කරමි. |
| **(ඉ)** | වෘත්තීය පුහුණු වැඩසටහන්වල ගුණාත්මකභාවය වර්ධනය කිරීමට අදාලව ප්‍රමාණවත් පරිදි අධ්‍යයන කාර්යමණ්ඩල බඳවා ගැනීම හා ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ලබා දීම සිදු කලයුතු වුවද අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතන 04 ක අනුමත කාර්යමණ්ඩලයේ කථිකාචාර්යවරුන් 81 දෙනෙකුගේ හා උපදේශකවරුන් 178 දෙනෙකුගේ පුරප්පාඩු පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. | අධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණුකිරීම් අඛණ්ඩව සිදුකල යුතු වීම හා අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා වූ පුරප්පාඩු පිරවීම් මගින් වෘත්තීය පුහුණුව ලබන සිසුන්ට විධිමත් හා ගුණාත්මක පුහුණුවක් ලබා දීමට කටයුතු කල යුතු වීම. | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙනි. ඒ අනුව පුරප්පාඩු පිරවීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබුණු පසු අදාල ආයතන විසින් කථිකාචාර්යවරුන්ගේ හා උපදේශකවරුන්ගේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ඇත. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අයවැය යෝජනාවක් මත මාතර දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ජාතික වෘත්තීය පුහුණු ආයතනය සඳහා 2017 වර්ෂයේ දී රු. මිලියන 200 ක් වෙන්කර තිබුණද අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් එම ව්‍යාපෘතිය කිලිනොච්චියේ පිහිටි ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ නේවාසිකාගාරයක් ඉදි කිරීම සඳහා වෙනස් කර තිබුණි. එසේ වුවද නව ව්‍යාපෘතිය විගණිත දිනය වූ 2019 මැයි 08 දක්වාම ආරම්භ කිරීමට කටයුතු නොතිබුණි. | ව්‍යාපෘති නිසි පරිදි සැලසුම් කිරීම හා කඩිනමින් ඉටුකිරීම තුලින් අරමුදල් කාර්යක්ෂමව යොදාගැනීමටත් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ සංවර්ධනයට ඉහල දායකත්වයක් ලබා දිය යුතු වීම. | කිලිනොච්චිය, ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ නේවාසිකාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව ඇගයීම් කමිටුව මගින් ලංසු ඇගයීමේ කටයුතු (Bid Evaluation) සිදු කරමින් පවතී. |
| (ආ) ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ හා අධ්‍යාපන හැකියාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (KOICA) 2017 වර්ෂයේ ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණද ඊට සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | සැලසුම්ගත ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව නිම කිරීම තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත යුතු වීම. | 2017 වර්ෂයේ සිට සුදුසු ඉඩම් යෝජනා වී අත්පත් කර ගැනීම් සිදු වුවත් ඇතිවූ විවිධ ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් හා ඉඩම්වල පාරිසරික වාර්තා සතුටුදායක තත්වයේ නොපැවතුණි. මේ වන විට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) පිහිටි ඉඩමෙන් කොටසක් අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

## 3.3 වෙනත් නිරීක්ෂණ

--------------------

### 3.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය අවසන් කර වර්ෂ 05 ක් ඉක්මවා තිබූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 415,750 ක ණය ශේෂයන් විගණිත දිනය වූ 2019 අප්‍රේල් 08 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිවිධාන ප්‍රකාරව ණය අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. | උක්ත කරුණ සම්බන්ධයෙන් වන සියලුම ලිපිගොනු රජයේ විගණන අංශය වෙත ලබා දී ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 9ක් ඇතුළුව තනතුරු 82 ක් පුරප්පාඩු වී පැවතුණි. | අමාත්‍යාංශයේ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට අවශ්‍ය කාර්යමණ්ඩල පවත්වාගත යුතුයි. | පිළිතුරු ලබා දී නැත. |